# මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පවතින පුරප්පාඩු ගණන | සේවය |
|---|---|---|---|
| 1. | රියදුරු III | 01 | මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන වල රියදුරු (ප්‍රාථමික ශිල්පීය) සේවය |
| 2. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III | 01 | මධ්‍යම පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවය |

02. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරුවලට හිමි වාර්ෂික වැටුප් පරිමාණයන් පහත පරිදි වේ.

| *අනු. අංක* | *තනතුරු නාමය* | *වැටුප් කේතය* | *වැටුප් පරිමාණය* | *කාර්යක්ෂමතා කඩඉම* |
|---|---|---|---|---|
| 1. | රියදුරු III | PL3-2016 | රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990<br>(2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 03/2016 හි විධි විධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ. මෙම වැටුප් පරිමාණය පූර්ණ වශයෙන් 2020.01.01 දින සිට ක්‍රියාත්මක වේ.) | බඳවා ගෙන වසර තුනක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතුය. |
| 2. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III | PL1-2016 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 12 x 330 - රු. 36,410<br>(2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 03/2016 හි විධි විධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ. මෙම වැටුප් පරිමාණය පූර්ණ වශයෙන් 2020.01.01 දින සිට ක්‍රියාත්මක වේ.) | බඳවා ගෙන වසර තුනක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතුය. |

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත අතර හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ සඳහා යටත් විය යුතුය.

ii. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට දායක මුදල් ගෙවිය යුතුය.

iii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයට යටත්ය.

iv. 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් එකී තනතුරට අදාළව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

v. සේවා ව්‍යවස්ථාවන්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි, සහ ඊට අමතරව රජය, පළාත් සභාව, පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරන නියෝගද, මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලටද මෙම පත්වීම යටත් ය.

vi. ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ බඳවා ගැනීම් වලට අදාල වන අනෙකුත් පොදු කොන්දේසි අදාල වේ.

04. *අවශ්‍ය සුදුසුකම් :*

4.01 රියදුරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :

*මූලික සුදුසුකම් :*

i. ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

ii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න අඛණ්ඩ වසර 03 ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. ( පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස ප්‍රමාණවත් සුදුස්සන් බල ප්‍රදේශය තුල නොමැති වූ විටක දී පමණක් යාබද පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ අයදුම්පත් සලකා බලනු ලැබේ.)

iii. අයදුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර අවුරුදු 45 ට අඩු විය යුතුය. (රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

iv. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

v. මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමකින් යුක්ත වීම.

vi. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ වී තිබිය යුතුය.

*අධ්‍යාපන සුදුසුකම් :*

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබිය යුතුය. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි.

*වෘත්තීය සුදුසුකම් :*

i. තාරබර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම, බඳවා ගන්නා දිනට වසර 03 ට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

*කායික සුදුසුකම් :*

i. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වීම.

ii. අවම උස අඩි 05 අඟල් 02 1/2 විය යුතුය.

*පළපුරුද්ද :*

1. රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර තුනක පළපුරුද්ද ලබා තිබිය යුතුය. (පළපුරුද්ද සහතික මගින් තහවුරු කළ යුතුය.)

04.02 *වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් :*

*මූලික සුදුසුකම් :*

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

ii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න, අඛණ්ඩ වසර 03 ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස ප්‍රමාණවත් සුදුසුසන් බල ප්‍රදේශය තුළ නොමැති වූ විටකදී පමණක් යාබද පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ අයදුම්පත් සලකා බලනු ලැබේ.)

iii. අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර අවුරුදු 45 ට අඩු විය යුතුය. (රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

iv. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ වී තිබිය යුතුය.

v. වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා රජයේ හෝ පෞද්ගලික ආයතනයක මාර්ග පවිත්‍ර කිරීම සහ මාර්ග නඩත්තු කිරීම සම්බන්ධයෙන් සේවා පළපුරුද්ද ලබා තිබීම පිළිබඳව විශේෂ අවධානය සම්මුඛ පරීක්ෂණයේ දී යොමු කරනු ලැබේ.

*අධ්‍යාපන සුදුසුකම් :*

i. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 ට සම්මාන සහිතව විෂයයන් හයක් සමත් වී තිබිය යුතුය. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

ii. 2015.09.22 දිනැති සේවා ව්‍යවස්ථා සංශෝධන - අංක 01 පරිදි ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පරිපාටියේ සඳහන් සුදුසුකම 5 ශ්‍රේණිය සමත් වීම දක්වා අඩු කර සලකා බලනු ලැබේ.

*කායික සුදුසුකම් :*

i. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වීම.

ii. දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

05.1 අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලුදෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් ලිපි ලේඛන හා ඒවායේ ඡායාස්ථ පිටපත් සූදානම්ව තබාගත යුතුය.

i. උප්පැන්න සහතිකයේ මුල් පිටපත,
ii. ජාතික හැඳුනුම්පත,
iii. රියදුරු තනතුර සම්බන්ධයෙන් රියදුරු බලපත්‍රය,
iv. අදාළ අධ්‍යාපන සහතිකයේ මුල් පිටපත,
v. පාසල හැරයාමේ සහතිකය,
vi. මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය,
vii. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්,
viii. වෘත්තීය නිපුනත්වය සනාථ කිරීමට අවශ්‍ය සහතික,
ix. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික/ලිපි.

05.2 වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුරු පුරප්පාඩු ගණන සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් වඩාත්ම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලකුණු අනුපිළිවෙළට තෝරාගෙන බඳවා ගනු ලැබේ.

05.3 රියදුරු තනතුරෙහි පුරප්පාඩු ගණන සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් සුදුසුකම් සපුරන සියලුම අපේක්ෂකයින් ලිඛිත පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන් වෘත්තීය පරීක්ෂණයකට යොමු කර එහි ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ.

06. *අයදුම් කළ යුතු ආකාරය* :

06.1 අයදුම්කරු තනතුරු කිහිපයක් සඳහා අයදුම්කරන්නේ නම් එක් තනතුරක් සඳහා එක් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

06.2 *ගැසට්* නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි A4 ප්‍රමාණයේ කොළයක දෙපැත්තම භාවිතා කර සකස් කරන ලද අයදුම්පතක් 2019.05.31 දින හෝ ඊට පෙර '' ලේකම්, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව, අම්පිටිය.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. (අයදුම්පත පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.)

06.3 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ''........................................ තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

06.4 අසම්පූර්ණ හෝ නියමිත දිනය පසුවී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප රු. 240,360 හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

06.6 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

07. බඳවාගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන කාලය අතරතුර කාල සීමාවේ දී මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමේ, මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ බලය හා මේ සම්බන්ධයෙන් වන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුය.

ලේකම්,
මහනුවර කඩවත් සතර සහ
ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව,
අම්පිටිය.

2019 මැයි මස 08 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ ................................ තනතුරු සඳහා අයදුම්පත

01. 1.1 මුලකුරු සමග නම :——————————————.

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.

02. 2.1 ස්ථිර ලිපිනය :——————————————.

2.2 දැනට රාජ්‍ය සේවයේ නිරත වූවෙකු නම් කාර්යාලයීය ලිපිනය :——————————————.

03. 3.1 උපන් දිනය :——————

3.2 2019.03.31 දිනට වයස අවු :—————— මාස :—————— දින :——————

04. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.

05. දුරකථන අංකය :——————————————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.

07. අධ්‍යාපන සුදුසුකම් :

7.1 අධ්‍යාපනය ලද පාසල :——————————

7.2 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය

වසර :—————————— විභාග අංකය :——————————

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

08. වෘත්තීය සුදුසුකම් :.............................................................................................................
.............................................................................................................

09. සේවා පළපුරුද්ද :.............................................................................................................
.............................................................................................................

10. *අයදුම්කරුගේ ප්‍රකාශය* :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත්වන බවත්, මම දනිමි.

——————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන............................................ (ලිපිනය) හි පදිංචි........................................... (නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී අත්සන තැබූ බවත්, සහතික කරමි.

——————————
සහතික කරන්නාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

දිනය :——————
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :——————
තනතුර :——————
ලිපිනය :——————

12. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.

මෙම ඉල්ලුම්කරුවන්................................. (නම) යන අය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ....................................... (තනතුර) වශයෙන් සේවය කරයි. පසුගිය වසර කිහිපය තුළ ඔහු මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදාහැරිය හැකි බවත් සහතික කරමි.

——————————
අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :——————